අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION
තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2025.01.24 මාධ්‍ය නිවේදන අංක: 2025/007/R

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**රු. 20,000/- ක (රුපියල් විසිදහසක) මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා ලබාගත් පොලිස් සැරයන්වරයෙකු අල්ලස් චෝදනා මත අත්අඩංගුවට**

ගිරිබාව ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව, පැමිණිලිකරු විවාහ වී සිට දැනට ඔහුව අතහැර ගොස් සිටින තම බිරිඳට විරුද්ධව පැමිණිලිකරු විසින් පවරන ලද වන්දි නඩුවට අදාළව බිරිඳට විරුද්ධව ඇති වරෙන්තුව ක්‍රියාත්මක කර, බිරිඳ අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කර දීම මඟින් හිඟ වන්දි මුදල් ලබා ගැනීමට උදව් කර දීම වෙනුවෙන් රු. 20,000/- ක (රුපියල් විසිදහසක) අල්ලස් මුදලක් ඉල්ලා එකී මුදල ලබා නොදුනහොත් පැමිණිලිකරුට විරුද්ධව යම් නීති විරෝධී කටයුත්තක් සම්බන්ධ කර නඩු පවරා සිරගත කිරීමට කටයුතු කරන බව පවසා, එය සිදු නොකර සිටීමට රු.20,000/=ක මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා, ලබාගත් ගිරිබාව පොලිස් ස්ථානයේ පොලිස් සැරයන්වරයෙකු 2025.01.24 දින ප.ව.1.22 ට පමණ පැමිණිලිකරුගේ නිවසේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරු ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය**
0112502672